" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන /தொலைபேசி/ Telephone - 011 - 2092599
ෆැක්ස් /பெக்ஸ்/ Fax - 011 - 2092601
ඊ-මේල් /மின்னஞ்சல்/ E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ENG-CON/5-2/FI/1 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2020.12.10 |

පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ/ වාරිමාර්ග අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ (ඉංජිනේරු),

සාමාන්‍යාධිකාරි,පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය(බ.ප.),

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ (කොළඹ,ගම්පහ,කළුතර)

පළාත් පාලන කොමසාරිස් සහ සියලුම පළාත් පාලන ආයතන ලේකම්වරුන්,

බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,

## ගොඩනැගිලි ගාස්තු උපලේඛණය - 2020/2021

බස්නාහිර පළාතේ පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයේ රීති අංක 425 ප්‍රකාර ගොඩනැගිලි ඉදිකිරීම් වැඩි දියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර ගැනීමට උපයෝගී කරගත යුතු 2020 සැප්තැම්බර් 01 දින සිට වලංගු ගොඩනැගිලි ගාස්තු උපලේඛණය මේ සමඟ ඉදිරිපත් කරමි. තවද මෙම ලේඛණය බස්නාහිර පළාත් සභාවේ පළාත් ඉංජිනේරු කාර්යාංශයේ වෙබ් අඩවියෙන් (eng.chiefsec.wp.gov.lk) බාගත හැක. මෙම ලේඛණය 2020.09.01 දින සිට නැවත දැනුම් දෙනතුරු වලංගු වේ.

02. මෙම ලේඛණයේ ඇතුළත් රේට් මිල ගණන් සඳහා එකතු කළ අගය මත බදු (VAT ), එකතු කර නොමැත.

03. මෙම ගොඩනැගිලි ගාස්තු ලේඛණයේ සඳහන් මිල ගණන් සකසා ඇත්තේ බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනම ආවරණය වන පරිදිය. කෙසේ වුවද, මෙහි සඳහන් ද්‍රව්‍ය වල මිල හා ඇතැම් බල ප්‍රදේශ තුල පවතින මිල ගණන් අතර සැලකිය යුතු වෙනස්කම් තිබේනම් ,ඒ පිළිබඳව මා වෙත දැන්වීමට පියවර ගන්න. එවැනි විශේෂ අවස්ථාවකදී යම් බල ප්‍රදේශයකට පමණක් සීමාවන පරිදි මිල ගණන් සංශෝධනය කිරීමට පියවර ගත හැක.ඇලුමිනියම් සහ ලී වල මිල ගණන් හැර මූලික ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල ගණන් තීරණය කර ඇත්තේ 2020 වසරේ පෙබරවාරි සහ මාර්තු මාස වල පැවති VAT රහිත මිල ගණන් පදනම් කරගෙනය. 2020.05.18 දින නිකුත් කරන ලද ඇලුමිනියම් වල මිල ගණන් ලේඛණය හා 2020.08.10 දින රාජ්‍ය දැව සංස්ථාව විසින් නිකුත් කරන ලද ලී මිල ගණන් ලේඛණය පදනම් කර ගෙන ඇලුමිනියම් හා ලී වල මිල ගණන් තීරණය කර ඇත.එම මිල ගණන් සඳහා වට්ටම් ඇතුළත් වී නැත.

04. මෙම රේට් මිල ගණන් පිළියෙල කර ගැනීමට උපයෝගී කරගෙන ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය සහ භාණ්ඩවල ප්‍රමිතිය (Specification) ,ගුණාත්මක බව (quality) සහ ඉදිකිරීම් නිමාව (Workmanship) ශ්‍රී ලංකා ප්‍රමිති (SLS), බ්‍රිතාන්‍ය ප්‍රමිති (BS - EN) සහ (A.S.T.M) ප්‍රමිතීන්ට අනුකූලව සහ ICTAD පිරිවිතර SCA/3/1, SCA/3/2, SCA/3/3, SCA/4(VOL – I), SCA/4(VOL - II), SCA/5, SCA/8 යන ප්‍රකාශනවල සඳහන් අවශ්‍යතාවයන් සහ ගුණාංගයන් සපුරාලන බව උපකල්පනය කරමිනි. ඒ අනුව මෙම මිල ගණන් උපයෝගී

කර ගෙන මුළු පිරිවැය ඇස්තමේන්තු සැකසීමේ දී සහ එකී ඇස්තමේන්තු පාදක කරගෙන ගිවිසුම් වලට එළඹ ගෙවීම් කිරීමේ දී ඉහත ප්‍රකාශනවල අඩංගු ප්‍රමිතීන්ට අනුකූල ගොඩනැගිලි ද්‍රව්‍ය පමණක් උපයෝගී කර ගෙන පුහුණු ශ්‍රමිකයන්ගේ දායකත්වයෙන්ද යුතුව ඉදිකිරීම් සිදුවිය යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

05. මෙම රේට් මිල ගණන් පදනම් කරගෙන පිළියෙල කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තුව, උද්ධමනය හෝ වෙනත් හේතූන් නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති අංක 4.3.3 ප්‍රකාරව යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය අවස්ථාවන්හිදී මිල විචලන සඳහා CIDA ආයතනයේ ප්‍රකාශිත ලංසු ලේඛන වල ඇතුළත් සූත්‍ර A හෝ B පදනම් කරගෙන රේට් මිල ලේඛණය වලංගු කළ දින සහ ඇස්තමේන්තු කරන දින අතර කාලවකවානුව තුළ සිදුව ඇති මිල විචලනය ගණනය කර ගැනීම සුදුසුය.

06. මෙම ගොඩනැගිලි ගාස්තු උපලේඛණයේ රේට් මිල ගණන් අදාළ කර ගෙන පිළියෙල කරනු ලබන මුලු පිරිවැය ඇස්තමේන්තු තාත්වික වනුයේ ප්‍රසම්පාදන සංග්‍රහයේ වගන්ති අංක 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6 සහ 3.8 හි සඳහන් ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරමින් ඉටු කිරීමට අපේක්ෂිත "වැඩ" (Works) කොන්ත්‍රාත් සඳහා පමණි. වගන්ති අංක 3.7 හි සඳහන් සේවායාගේ සේවකයන් (එනම් සෘජු කම්කරු ශ්‍රමය, ද්‍රව්‍ය සහ උපකරණ යොදා Force Account යටතේ) හෝ සේවායා විසින් ද්‍රව්‍ය සපයා ශ්‍රම කොන්ත්‍රාත් මත හෝ ප්‍රජා දායකත්වය යටතේ ඉදිකිරීමට අපේක්ෂිත වැඩ සඳහා මෙම රේට් මිල ගණන් වලංගු නොවන අතර එවැනි ඉදිකිරීම් සඳහා 20% ලාභාංශ සහ අනෙකුත් වියදම් සමානුපාතිකව අඩුකර මුලු පිරිවැය ඇස්තමේන්තු සකස් කල යුතුවේ.

07. මෙම ගොඩනැගිලි ගාස්තු ලේඛනයේ වැඩ විස්තර සහ රේට් මිල ගණන් පදනම් කර ගෙන සකස් කර ගන්නා ප්‍රසම්පාදන ලියකියවිලි කට්ටලයට ඇතුළත් විය යුතු අනෙකුත් ලිපි ලේඛන සහ ගොඩනැගිලි ගාස්තු ලේඛණය පරිශීලනය කිරීමේදී සෑම නිලධාරියෙකු විසින්ම දැන සිටිය යුතු කරුණු සංක්ෂිප්තව ඇස්තමේන්තු අත්පොතේ (Estimating manual) හි ඇතුළත් කර ඇත. එම අත්පොත ඉහත වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත. මෙම අත්පොත නිරන්තරයෙන් යාවත්කාලීන වන ලේඛණයක් බැවින් වරින් වර වෙබ් අඩවියට ඇතුළු වී යාවත්කාලීන කරන ලද ලේඛණයේ (version) අංකය සමග සසඳා පරිශීලනයට ගත යුතු වේ.

08. පරිසරයට සිදුවන හානිය අවම කර ගැනිම සඳහා රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ වල උපදෙස් ප්‍රකාර ගංගා වලින් ලබා ගන්නා වැලි වෙනුවට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLRDC) විසින් අලෙවි කරනු ලබන"washed off-shore sand" හෝ "manufactured sand " යොදා ගත හැකි පරිදි රේට් මිල ගණන් ගලපා ඇත.

09. මෙම රේට් මිල ගණන් ගණනය කිරීමට පදනම් කර ගත් කම්කරු ගාස්තු, විශේෂිත ශ්‍රම කොන්ත්‍රාත්කරුවන්ගේ සේවා ගාස්තු, විශේෂිත උප කොන්ත්‍රාත්කරුවන්ගේ (එනම් ද්‍රව්‍ය සහ ශ්‍රමිකයන් සමඟ සේවා/ වැඩ සපයන්නන්ගේ) සේවා ගාස්තු, ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ගනන්, නිමි භාණ්ඩ වල මිල ගණන්, සහ ප්‍රවාහන ගාස්තු ඉහත වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

10. තරඟකාරී මිල ගණන් යටතේ ලංසු කැඳවීමේදී රේට් මිලක තාත්වික බව තීරණය වනුයේ විවිධ සාධක මතය. ඉන් ප්‍රධාන සාධක කිහිපයක් පහත දැක්වේ.

I. කොන්ත්‍රාත්කරුවකු විසින් ප්‍රමාණ බිල්පතට අයත් වැඩ කොටස් ඉටු කරනු ලබන ආකාරය (එනම් පහත අයිතම අංක 11 "අ" සිට "ඇ" දක්වා වූ ක්‍රමවේද අතුරින් එකක් මත වීම)

II. ඉටුකරනු ලබන ඉදිකිරීමේ අවධානම (risk) මත

III. ඉදිකිරීමට අදාල ප්‍රාරම්භක අයිතම (preliminaries) ප්‍රමාණ බිල්පතට ඇතුළත්ව තිබේද යන්න මත
IV. කොන්ත්‍රාත්කරුවකු සතු උපකරණ සහ අනෙකුත් මෙවලම්
V. ඉදිකිරීමක සීමිත කොටසක් පමණක් නිම කළ යුතුව තිබෙන අවස්ථාවක කම්කරු දායකත්වයට වඩා ද්‍රව්‍ය වල දායකත්වය වැඩි වීම, අඩුවීම සහ/ හෝ විශේෂිත උප කොන්ත්‍රාත්/ ශ්‍රම කොන්ත්‍රාත් ලබා දීම සීමිත වීම.
VI. කොන්ත්‍රාත්කරුවන්ගේ ඉදිකිරීම් කළමනාකරණ හැකියාව
VII. සේව්‍යාගේ මූල්‍ය හැකියාව, විශ්වාසනීයත්වය සහ සේව්‍යයා විසින් නම් කරනු ලබන කොන්ත්‍රාත් කළමනාකරණයට සම්බන්ධ නිලධාරීන්ගේ ප්‍රවීනත්වය
VIII. ඉදිකිරීමේ සංකීර්ණ බව හා ව්‍යාපෘතියේ භූගෝලීය පිහිටීම
IX. කොන්ත්‍රාත්කරුවකු විසින් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීමේදී එම ද්‍රව්‍ය සඳහා ලබා ගන්නා වට්ටම් සහ සහන ගෙවීම් කාලය මත
X. ලංසුව ඉදිරිපත් කරන අවස්ථාවේ කොන්ත්‍රාත්කරු සතුව පවත්නා අනෙකුත් වැඩ වල වටිනාකම

මෙම සියළු කරුණු පදනම් කර ගෙන මුළු වර්ෂය සඳහා ස්ථාවර වූ තාත්වික රේට් මිල ගණනක් තීරණය කිරීම ප්‍රායෝගිකව අපහසු වේ. එබැවින් මෙම රේට් මිල ගණන් තීරණය කර ඇත්තේ මිලියන 150 ට අඩු වටිනාකමින් යුතු මහල් 5 කට පමණ සීමා වන ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා පහත අංක 11 හි සඳහන් ක්‍රමවේද අතුරින් එක් ක්‍රමවේදයක් අනුගමනය කරමින් මෙම ලේඛණයේ සඳහන් ප්‍රමිතීන්ට අනුකූල ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පුහුණු ශ්‍රමිකයන් යොදා ගනිමින් ඉදිකිරීම් ඉටුකරනු ලබන්නේ යැයි යන උපකල්පනය මත රැඳෙමිනි.

එම නිසා මෙම රේට් මිල ගනන් හුදෙක් ඇස්තමේන්තුගත රේට් මිල ගනන් බවට අවධාරණය කරනු ලබන අතර ඒවායේ නිරවද්‍යතාව බොහෝ දුරට ඉදිකිරීමේ ස්වභාවය, භූමියේ පිහිටීම සහ සංකීර්ණත්වය මත රඳා පවතී.

මෙම රේට් මිල ගනන් වලට අයත් නොවන රේට් මිල ගනන් තීරණය කිරීමේදී මෙම ලේඛණයට පදනම් කර ගත් කම්කරු ගාස්තු සමඟ ඉදිකිරීම් ඉටුකිරීමට යෝජිත ප්‍රදේශයෙන් ලබාගත් ද්‍රව්‍ය මිල ගනන් හෝ මෙම ලේඛණයට පදනම් කර ගත් මූලික මිල ගනන් සමඟ 20% ලාභාංශය ඇතුළත් වන පරිදි ඉදිකිරීම් ඉටුකිරීමට උපයෝගී කර ගත හැකි ක්‍රමවේදය “method statement” පිළිබඳව නිසි අවබෝධයෙන් යුතුව පිළියෙල කර ප්‍රාදේශිය ඉංජිනේරුගේ අනුමැතිය ගත යුතු අතර ගොඩනැගිලි අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ ඉංජිනේරුගේ අවධානයට යොමුකර අනාගතයේදී එවැනි විශේෂිත රේට් මිල ගණන් විශ්ලේෂණ නැවත පරිශීලනය සඳහා ඩිජිටල් තාක්ෂණයෙන් ගබඩා කිරීම සඳහ පියවර ගත යුතු වේ.

11. තවද මෙම රේට් මිල ගණන් ගණනය කිරීම සඳහා නිරන්තරයෙන් එකතුවන නවීන තාක්ෂණ “මෙවලම්” උපකරණ යොදා ගනිමින් අඩු ශ්‍රමයක් උපයෝගී කර ගෙන ඉටු කරනු ලබන කාර්යයන් සඳහා සම්ප්‍රදායික මිල විශ්ලේෂණ පදනම් කර ගෙන ගණනය කරනු ලබන රේට් මිල ගනන් තාත්වික නොවන බව පසුගිය වසර 10 තුළ සිදු කළ අධ්‍යයනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව වර්තමානයට ගැලපෙන පරිදි “Work study” සහ “Method study” මඟින් තහවුරු කරගත් ගොඩනැගිලි මිල විශ්ලේෂණයක අවශ්‍යතාව පිළිබඳව අවධාරණය කරනු ලබන අතර එවැනි ලේඛණයක් සැකසෙනතුරු එතෙක් පහත ක්‍රම අතුරින් වඩාත් සුදුසු යැයි සහ මධ්‍ය පරිමාණයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා CIDA ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වැඩි දෙනෙකු විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේද මත රැඳෙමින් මෙම රේට් මිල විශ්ලේෂණය කර ඇත.

එසේ විශ්ලේෂණය කරන ලද මිල ගනන් වල තාත්වික බව ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතුවන් සමඟ සාකච්ඡා කර තහවුරු කර ඇත.

(අ) කොන්ත්‍රාත්කරු විසින් භාණ්ඩ මිලදී ගෙන තම සාජු කම්කරුවන් (පුහුණු සහ නුපුහුණු) යොදවා ඉටු කරනු ලබන කාර්යයන් (මෙම කාර්යයන් විශ්ලේෂණය සඳහා CIDA ආයතනයෙන් මුද්‍රණය කර අලෙවි කරන මිල විශ්ලේෂණ ලේඛනය හැකිතාක් දුරට පාදක කර ගනිමින්)

(ආ) ප්‍රධාන කොන්ත්‍රාත්කරු ද්‍රව්‍ය සපයා විශේෂිත සේවා සපයන උප කොන්ත්‍රාත් ශ්‍රමිකයන් යොදවා (නිදසුන : පින්තාරු කිරීම)

(ඇ) උප කොන්ත්‍රාත්තුවක් ලෙස විශේෂිත උප කොන්ත්‍රාත්කරුවන් විසින් (ද්‍රව්‍ය සහ ශ්‍රමය සපයා) ඔවුන් විසින් ඉටු කරනු ලබන කාර්යයන් (නිදසුන : ජල ප්‍රතිරෝදනය)

12.මෙම රේට් මිල ගණන් තුළ ඇතුළත් 20% උඩිස් හා ලාභාංශ සඳහා CIDA ආයතනයේ නිර්දේශ පරිදි යම් ඉදිකිරීමකට අදාල වන්නා වූ ප්‍රාරම්භක අයිතම (preliminaries) වල මිල අඩංගු නොවේ. එබැවින් යම් වැඩකට ප්‍රමාණ බිල්පත පිළියෙල කිරීමේදී ඉදිකිරීමේ ස්වභාවය ප්‍රාරම්භක (preliminaries) අයිතම ලංසුකරුට තරඟකාරී ලෙස මිල කිරීම සඳහා ප්‍රමාණ බිල්පතට ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

Preliminary items ඇතුළත් ලැයිස්තුවක් වෙබ් අඩවියේ ඇතුළත් කර ඇති අතර එම අයිතම අතුරින් ඉදිකිරීමට අත්‍යවශ්‍ය වන්නාවූ අයිතම පමණක් ඇතුළු කළ යුතු වේ.

13. එක් එක් රේට් මිල ගණන් වලට ඇතුළත් විය යුතු අයිතම පිළිබඳ විග්‍රහයක් "General preamble" සහ "Pricing preamble"වල ඇතුළත් කර ඇති අතර එකී ලේඛන මෙම රේට් මිල ගණන් වලම කොටසක් ලෙස සැලකිය යුතු අතර මෙම රේට් මිල ගණන් පදනම් කර ගෙන සකස් කරනු ලබන ප්‍රමාණ බිල්පත් ලංසු කැඳවීමට උපයෝගී කර ගන්නා අවස්ථාවන්හිදී එකී " General preamble" සහ "Pricing preamble" ද ලංසු ලේඛන වල කොටසක් විය යුතු අතර ඒවාද පැහැදිලිව ඇතුළත් වී ඇති බවට සනාථ කර ගත යුතු වේ. මෙම" General preamble" සහ "Pricing preamble" අවස්ථානුකූලව සහ වරින් වර වැඩිදියුණු කරනු ලබන බැවින් ලංසු කැඳවන අවස්ථාවේ වෙබ් අඩවියේ ඇතුළත් යාවත්කාලීන කරන ලද නව පිටපත බාගත (download) කරගත යුතු බව අවධාරණය කරමි.

14. මෙම රේට් මිල ගනන් හුදෙක් උපකල්පන මත රැඳෙමින් සකස් කරන ලද ඇස්තමේන්තු ගත රේට් මිල ගණන් බව අවධාරණය කරනු ලබන අතර තරගකාරී ක්‍රමයට කැඳවන ලද ලංසු එකිනෙක සමඟ සැසඳීම සඳහා පාදක කර ගත යුතු මෙවලමක් ලෙස භාවිතා කිරීමට සහ යම් ව්‍යාපෘතියකට මුදල් වෙන් කිරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යම්තාක් දුරට නිරවද්‍යතාවයකින් යුතුව සකසා ගැනීම සඳහා මෙම රේට් මිල ගණන් පදනම් කර ගැනීම සුදුසු බවට වැඩිදුරටත් අවධාරණය කරනු ලැබේ.

15. මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී භාවිතා කිරීම සඳහා මෙම ලේඛනයේ පිටපත් අදාල තාක්ෂණ නිලධාරීන් වෙත කරුණාකර නිකුත් කරන්න.

*සටහන: මෙම ශාස්තු ලේඛණයේ Fine Aggregate (වැලි) උපයෝගී කර ගනු ලබන අයිතම වල රේට් මිල ගණන් තීරණය කර ඇත්තේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීම් සංස්ථාව විසින් අලෙවි කරනු ලබන off-shore sand මිල ගනන් පදනම් කර ගෙනය. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරුවරයා විසින් වැර ගැන්වූ කොන්ක්‍රීට් සඳහා මෙම වැලි උපයෝගී කර ගැනීමට අවසර දීමේදී

පහත සඳහන් ලේඛණ පරීක්ෂාවට ලක් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රමිති 1397:2010 පිරිවිතරට අනුකූල බවට සහතික කළ යුතු වේ.

(අ) කොන්ත්‍රාත්කරු විසින් වැලි සපයනු ලබන ආයතනයන් විසින් SLS 1397:2010 වගන්ති අංක 5 ප්‍රකාර ලිඛිත තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ.

(ආ) වැඩ බිමට වැලි ගෙන ඒමෙන් පසු අහඹු ලෙස තෝරා ගත් සාම්පල් රසායනාගාර පරීක්ෂණයකට ලක් කර Shell content (සිප්පි කටු ප්‍රමාණය), Chloride content (ක්ලෝරයිඩ් අයන ප්‍රමාණය) සහ Gradation (වැලි ඇටවල විහිදීම) SLS 1397:2010 සඳහන් නිර්නායක වලට අනුකූල බවට සනාථ කර ගත යුතු වේ.

ඒ.ඒ.පී.එස්.කේ.කරුණාරත්න,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
බස්නාහිර පළාත.

ඒ. ඒ. පී. එස්. කේ. කරුණාරත්න
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
පස්වන මහල, අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

පිටපත්:

| | | |
|---|---|---|
| 1. | ප්‍රධාන ලේකම් (බ.ප.) | : කරු.දැ.ස. |
| 2. | දිස්ත්‍රික් ලේකම්වරුන් (කොළඹ/ ගම්පහ/ කළුතර) | : දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරුන්ගේ දැනගැනීම සඳහා යොමුකරන්න |
| 3. | බස්නාහිර පළාතේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් | : දැ.ස. |
| 4. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය/ සැලසුම්) | : දැ.ස. |
| 5. | අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) | : දැ.ස. |
| 6. | විගණන අධිකාරි | : දැ.ස. |